# ලංසු කැඳවීමයි

## නොරොච්චෝලය ලක්විජය විදුලි බලාගාරයේ ප්‍රධාන ආපනශාලාව පවත්වාගෙන යාම - 2022/2023

01. නොරොච්චෝලය ලක්විජය බලාගාරයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2022/2023 යන වසරක කාලයක් සඳහා එහි ආපන ශාලාව පවත්වාගෙන යාමට සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. බලාගාරයේ පිහිටි ආපනශාලාවෙන් මෙහි සේවය කරන සේවක මහත්ම/ මහත්මීන් 800ක පමණ පිරිසකට සේවය සැපයිය යුතුය .

03. ආපනශාලාව සඳහා ජලය, විදුලිය හා ගෑස් නොමිලේ සපයනු ලැබේ. ආහාරපානවල මිල ඉදිරිපත් කිරීමේදී මෙම පහසුකම් සැලකිල්ලට ගත යුතුය.

04. රජයේ කොන්ත්‍රාත් කොන්දේසි කඩ කර, අසාධු ලේඛනගත කොට ඇති පුද්ගලයින් හා රජයේ සුභසාධන ආපනශාලා පවත්වාගෙන යෑමේදී රජයට අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති හා ගිවිසුම් කඩකර ඇති අයට හෝ ඔවුන්ගේ නියෝජිතයින් වෙත ලංසුපත් නිකුත් කරනු නොලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසුව බලස්ථාන කළමනාකරු, ලක්විජය විදුලි බලාගාරය, ලංකා විදුලිබල මණ්ඩලය, නාරක්කල්ලිය, නොරොච්චෝලේ යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.

06. ලක්විජය බලාගාරයේ තුන් වන මහලේ ප්‍රසම්පාදන අංශයේ දී **2022-01-21 දින සිට 2022-02-08** දින දක්වා වැඩ කරන දින වල **පෙ.ව. 9.00 සිට ප.ව. 5.00** දක්වා රු.1000/- ක මුදලක් ගෙවා ලංසු පත්‍රිකා ලබා ගත හැක.

07. **2022-02-02 දින පෙ.ව. 10.00** ට ලක්විජය බලාගාරයේ තුනවන මහළ ප්‍රසම්පාදන අංශයේ දී ලංසු පත් ලබාගන්නා සියළුම ලංසු කරුවන් සඳහා ලංසුවට පෙර පවත්වනු ලබන ලංසුපත් පිරවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වේ. ලංසු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සියලුම දෙනා මෙයට පැමිණීම අනිවාර්ය වේ.

08. **2022-02-09 දින ප.ව. 2.00**ට ලක්විජය බලාගාරයේදී ලංසු විවෘත කරනු ලැබේ. එබැවින් එදින **ප.ව.2.00** ට පෙර ලැබෙන සේ මිල ගණන් එවන මෙන් දන්වා සිටිමු.

09. එම ලංසු විවෘත කිරීමේ අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියොජිතයෙකුට සහභාගී විය හැක.

10. ප්‍රසම්පාදන අංශයේ දුරකථන අංකය **071 5777171** වෙතින් තොරතුරු ලබා ගත හැක.

11. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

12. තොරතුරු පිටපත - Click Here

**බලස්ථාන කළමනාකරු (ලක්විජය බලාගාරය),**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**නාරක්කල්ලිය,**
**නොරොච්චෝලේ.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD